# කලාව හා අධිපතිවාදය

සිංහල සංගීතයක් යනුවෙන් හැඳින්විය හැකි සංගීතයක් ඇති බව බොහෝදෙනා පිළිගනිති. ඉතා ටිකදෙනකු සංගීතයක් යැයි කිවහැකි දෙයක් සිංහලයන්ට තිබේද යනුවෙන් ප්‍රශ්නයක් නැගීමට ඉඩ ඇතත් තවත් ටිකදෙනකු සංගීතය එලෙස සිංහල, පෙරදිග, අපරදිග යනුවෙන් බෙදීමට හැකිදැයි ප්‍රශ්නකිරීමට ඉඩ ඇතත් බොහෝදෙනකු සිංහල සංගීතය යනුවෙන් පද්ධතියක් ඇතැයි කියනු ඇත. මෙහි දී අප සිංහල සංගීතය යනුවෙන් හඳුන්වන්නේ සිංහල ගීතය ම නොවන බව පළමුවෙන් ම සඳහන් කළයුතු වන්නේ උපකල්පන පිළිබඳ ඇතැමුන්ට ප්‍රශ්න ඇතිවිය හැකි බැවිනි. ඉහත සඳහන් අයුරින් සිංහල සංගීතය පිළිබඳ ව අඩුම තරමින් මත තුනක් තිබිය හැක්කේ මූලික වශයෙන් ම සංගීතය පිළිබඳ ඇති නිර්වචන (අර්ථදැක්වීම්) කිහිපයක් තිබෙන බැවින් ය. ශාස්ත්‍රීය යැයි කිවහැකි සංගීතයක් පමණක් සංගීතය ලෙස හඳුනාගන්නා අයකු සිංහල සංගීතයක් නැතැයි කීමට ඉඩ ඇත. නිර්වචන යනු මතවාද මිස අනෙකක් නො වෙයි. මතවාද ඇතිවන්නේ සුසමාදර්ශ මත පදනම්වෙමින් ය. සුසමාදර්ශ ඇතිවන්නේ චින්තන මත පදනම්වෙමිනි. ඒ සියල්ල අවසාන වශයෙන් දැනුම හා සම්බන්ධ ය. සිංහල සංගීතයක් ඇතැයි කියන්නා පවා සිංහල සිනමාවක් යනුවෙන් යමක් ඇතැයි ඇතැම්විට නොකියනු ඇත. මෙය ද නිර්වචන, ඒ නිසාම මතවාද පිළිබඳ ප්‍රශ්නයක් වෙයි. සිංහල සිනමාව යනු සිංහල දෙබස් ඇති සිනමාවක් ද? එසේත් නැත්නම් සිංහල අධ්‍යක්ෂකවරයකු විසින් නිර්මානයකෙරුණු සිනමාවක් ද? සිංහල නවකතා යනු සිංහලෙන් ලියැවුණු නවකතා ද? සිංහල කෙටිකතාව ජාතක කතාවේ විකාශයක් ද? සිංහල ගණිතයක්, සිංහල භෞතික විද්‍යාවක් තිබිය හැකි ද? සිංහල ගණිතය යනු ඇතැමුන්ට පහළොස්වැනි සියවසට පෙර ලංකාවේ පැවති ගණිතයකි. මේ ප්‍රශ්නවලට පිළිතුරු ඇත්තේ තම තමන් පදනම්වන චින්තනයෙහි ය. එහෙත් එයින් කියැවෙන්නේ ඕනෑම අයකුට ඕනෑම අදහසක් ඉදිරිපත් කළහැකිය යන්න නො වෙයි. එහි දී තමන් දරන අනෙක් අදාළ මත සමග එහි සංගතබවක් තිබිය යුතු ය.

සිංහල සංගීතයක් ඇතැයි කියන්නවුනට බටහිර සංගීතය සිංහල සංගීතයට අවශෝෂණයකරන්නේ කෙසේ ද යන්න ප්‍රශ්නයක් විය යුතු ය. එහෙත් ඇතැමුන් බටහිර සංගීතය අමු අමුවේම අනුකරණයකරනු දැකිය හැකි ය. ඔවුන් කෙතරම් උත්සාහකළ ද ඒ සාර්ථක නොවනු ඇත්තේ අවශෝෂණය කෙරෙන අන්දම පිළිබඳ යම් නීතියක් රීතියක් ඒ ඒ සංස්කෘතියෙහි තිබෙන බැවිනි. එහෙත් අසාර්ථක ව්‍යාපෘතිවල නිරත වුවද සමාජයේ ඔවුන් දරණ මතවාදයට ඇති ආධිපත්‍යය හේතුකොටගෙන ඔවුන්ට ප්‍රදාන හා පිළිගැනීමක් ලැබෙයි. සමාජයෙහි යමකුට පිළිගැනීමක් ලැබීමේ දී බලපාන ප්‍රධාන සාධකය අදාළ පුද්ගලයා සමාජයේ අධිපතිවාදී මතවාදය සමග කෙතෙක් දුරට බැඳී ඇත් ද යන්න සමග ය. මෙරට අධිපතිවාදී මතවාදය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ මතවාදය ය. එහි විවිධ ප්‍රභේද තිබිය හැකි ය. සිංහල සංගීතයට බටහිර සංගීතය අවශෝෂණයකිරීම ප්‍රශ්නයකි. සිංහල නවකතාව ජාතක කතාවේ විකාශයක් ලෙස සලකන්නන් සිටිය ද, ඒ එසේ යැයි සිතීමට නො හැකි ය. නවකතාව බටහිර නිර්මානය වුවකි. සිංහල කතාකීමේ රටාවට (අවශ්‍ය නම් ආඛ්‍යාන රීතියට) බටහිර නවකතාව අවශෝෂණයකරන්නේ කෙසේ ද යන ප්‍රශ්නය ඇසිය යුතුව තිබූ නමුත් ඒ ඇසූ කෙනකු නැත. වත්මන් සමාජයෙහි සිංහල නවකතාව යනු පොදුවේ ගත්කල බටහිර වියුක්ත සම්ප්‍රදාය අනුකරණයකෙරෙමින් සිංහලෙන් ලියැවෙන කතා ය. එහි විවිධ රීති තිබිය හැකි ය. එහෙත් ඒ විවිධ රීති ද බටහිර රීති අනුකරණයකිරීමක් පමණකි. අදාළ විචාර ද බටහිර විවිධ විචාර තම තමන්ට තේරෙන ආකාරයට අනුකරනයකිරීම පමණ ය. ඒ බටහිර අන්දමට ම අනුකරනයකෙරී නැත්නම් ඉන් කියැවෙන්නේ ඒ ඒ විචාරකයාගේ නිර්මානශීලීත්වයක් නොව අදාළ පුද්ගලයාට අදාළ බටහිර විචාරය තේරුම්ගොස් ඇති ආකාරය ය.

සිංහල නවකතාව හෝ සිංහල කෙටිකතාව හෝ බටහිර අනුරූප කතා සිංහල කතාකීමේ රීතියකට අවශෝෂණය කිරීමෙන් නිර්මානයකරන්නේ කෙසේ ද යන්න විමසීමකට ලක්කල හැකි නමුදු සිංහල සිනමාව සම්බන්ධයෙන් එවැන්නක් හෝ කිව නො හැකි ය. එයට හේතුව බටහිර බිහිවූ සිනමාවට අනුරූප කලා මාධ්‍යයක් මෙරට කලින් නො තිබීම ය. අපට කළහැකිව තිබුණේ බටහිර සිනමාව පොදුවේ ගත්කල සිංහල සංස්කෘතියට අවශෝෂණයකරන්නේ කෙසේ ද යන්න විමසා බැලීම ය. එහෙත් මෙරට නොකෙරී ඇත්තේ ද එයම ය. සිනමාව සම්බන්ධයෙන් ගත්කල මෙරට කෙරී ඇත්තේ අනුකරණ පමණ ය. අප කර ඇත්තේ සිංහලෙන් දෙමළ චිත්‍රපටි හෝ බටහිර රොමැන්ටික් චිත්‍රපටි හෝ ප්‍රංශ චිත්‍රපටි හෝ වෙනත් චිත්‍රපටි නිෂ්පාදනයකිරීම ය. චිත්‍රපටි අධ්‍යක්ෂකවරු යැයි කියන්නවුන් කෙතෙක් සිටිය ද අපට ඇත්තේ චිත්‍රපටි නිෂ්පාදකවරු පමණ ය. මැතක දී බටහිර බිහිවූ කලා මාධ්‍යයක් අපේ සංස්කෘතියට අවශෝෂණය

© Prof. Nalin De Silva

කරගත නොහැකි වී ඇත්තේ විවිධ රීතිවලින් චිත්‍රපට නිපදවීම සඳහා විවිධ අවස්ථාවල අතගැසූ පුරෝගාමීන් හුදු අනුකාරකයන් වීම ය. බටහිර නිර්මානයකරන ලද ඇතැම් රීති කෙතරම් දුරකට අපේ සංස්කෘතියට ගැලපේ ද යන්න ඔවුහු සිතා නො බැලූහ. රේඛාව යනු සිංහලෙන් නිපදවූ බටහිර රොමෑන්ටික් චිත්‍රපටියක් නම් සුළඟ එනු පිණිස යනු සිංහලෙන් නිපදවූ කසිකබල් ප්‍රංශ චිත්‍රපටියකි. එයට ප්‍රංශයේ දී ලැබුණු තෑග්ගෙන් හෝ හිටපු ජනාධිපතිනියගෙන් ලැබුණු සම්මානයෙන් හෝ අනුකාරක විශ්වවිද්‍යාලයීය පරිවාසී ඇදුරකුගේ සහතිකයකින් හෝ සිහිමොළයක් ඇති අයකු මුළා නොවනු ඇත.

මෙරට සිනමාව තබා නවකතා හා කෙටිකතා සම්බන්ධයෙන් වත් සිංහල විචාර කලාවක් ගොඩනැගී නැත. අප දන්නේ අනුකරනය පමණකි. එය ද ඒ ඒ අයගේ දැනුම විශ්ලේෂණ ශක්තිය ආදියේ ප්‍රමාණයට බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. කලා විචාරය මතු නොව කලාව කලාවක් ලෙස බටහිර වර්ධනයවීමට පටන්ගැණුනේ පහළොස්වැනි සියවසෙන් පමණ පසු ය. කෙටියෙන් කිවහොත් කලාව යනු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ප්‍රතිඵලයකි. ඉන් පෙර කලාව, කලාව ලෙස අනෙක් ක්ෂෙත්‍රවලින් වෙන් වී නො පැවතිණි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වෙයි. ඒ ඒ පුද්ගලයා අනෙක් පුද්ගලයන්ගෙන් වෙන්කිරීම, ඒ ඒ විෂය අනෙක් විෂයන්ගෙන් වෙන්කිරීම, විශ්ලේෂණය, පුද්ගලයා සමාජයට වඩා ප්‍රමුඛත්වයක් ලැබීම, ඊනියා පුද්ගලික නිදහස, පුද්ගලයාට තම පසිඳුරන් පිනවීමට අන්‍යයකුට හිරිහැරයක් නොවනතාක් දුරකට ඉඩදීම ආදිය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි මූලික ලක්ෂණ වෙයි. අද බටහිර නවකතාවට සමාජ විශ්ලේෂණයෙන් බැහැරවීමට (වෙන්වීමට) බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙන් බලකෙරෙයි. බටහිර සිනමාවට බටහිර නවකතාවෙන් බැහැරවීමට බලකෙරෙයි. නවකතාව, නවකතාවෙන් පමණක් කළහැකි දෙයට සීමාවිය යුතු යැයි කුන්දේරා කියයි. බටහිර සිනමාව සංකල්ප රූපවලින් හැකිතාක් දෙබස් නොමැතිව ප්‍රකාශවිය යුතු යැයි කියැවෙයි. අප ඒ සියල්ල එසේ අනුකරනය කළ යුතු ද? දෙබස් අවම වූ චිත්‍රපටියක් සිංහල චිත්‍රපටියක් විය හැකි ද? සිංහල චිත්‍රපට නොනිපදවන රටකට ඒ ප්‍රශ්නය වලංගු ද?

සිනමා කෘතියක් විවේචනය කළයුත්තේ කෙසේ ද? ලෝකයේ කිසිම රටක බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි වුව ද, ශුද්ධ වූ කලාකෘති නිර්මානය නො වෙයි. ශුද්ධ වූ ගණිතයක් ශුද්ධ ගණිතයේවත් නැත. සෑම කෘතියක් ම වෙනත් කෘති සමග සම්බන්ධ වෙයි. ඒ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ඇති පරස්පරයකි. කෙතරම් වෙන්කිරීමට උත්සාහකළ ද, ඒ ඒ විෂය අතර ඇති සම්බන්ධය පොදු චින්තනය ඔස්සේ මතුවෙයි. දොස්තොව්ස්කිගේ නවකතාවල චරිත අයින්ස්ටයින්ගේ භෞතිකවිද්‍යාවෙහි දැකිය හැකි ය. පිකාසෝගේ චිත්‍රවල ඇත්තේ සාපේක්ෂ අවකාශයක් හා සාපේක්ෂ කාලයකි. ක්වොන්ටම් භෞතිකයෙහි ඇතැම් අවස්ථාවල කාලය අර්ථ නො දැක්වෙයි. මුල මැද අග යන්න එහි දී භ්‍රාන්තියක් පමණක් වෙයි. මුල මැද අග නැති කලා කෘති ගැන බටහිර ඉගැන්වෙයි. වියුක්ත හෙවත් අමූර්ත කලා කෘති වියුක්ත ගණිතඥයකුට හෝ වියුක්ත සෛද්ධාන්තික භෞතික විද්‍යාඥයකුට හෝ නුහුරු දෑ නො වෙයි. කලා කෘතියකින් සන්දර්භය ඉවත්කළ හැකි නො වෙයි. “සුළඟ එනු පිණිස” යනු සිංහලෙන් නිෂ්පාදනය වූ කසිකබල් ප්‍රංශ චිත්‍රපටියකි යන්නට අප එළඹෙන්නේ තවත් එවැනි කරුණු සළකාබැලීමෙන් පසුව ය. එහෙත් අපේ සරසවිවල ඉගැන්වෙන සිනමා විචාරය යනු ශිෂ්‍යශිෂ්‍යාවන්ගේ මොළ සෝදන අනුකාරක විචාරයකි. අසම්මත නාට්‍ය යුරෝපයේ නිර්මානයවීමට හේතුභූත වූ කරුණු කවරේ ද? ඒ හේතු අප රටේ ඇත් ද? ඊනියා යථාර්ථයක් ගැන වාස්තවිකත්වයක් ගැන කතාකරමින් මේ සාපේක්ෂකත්වය යටකිරීමට බටහිර අධිපතිවාදී දර්ශනය හා කලාව උත්සාහ කරයි. මනසෙන් බාහිර වූ යථාර්ථයක් (හෝ යථයක්) පවතින බව මනසින් තොරව පෙන්වාදීමට කිසිවකුටවත් නො හැකි ය. මේ වාක්‍යය තේරුම්ගත නොහැකි හිනමානයෙන් පෙළෙන ඇතැම්හු ඊනියා යථයක් ඇති බව පෙන්වීමට උත්සාහ කරති. මනස මනසේ ම නිර්මානයක් වෙයි. නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණය ද මනසේ නිර්මානයක් පමණක් වෙයි. එහෙත් මේ සියල්ල මැද බටහිර ආධිපත්‍යය ක්‍රියාත්මක කිරීමට උත්සාහ ගැනෙයි. මෙරට බටහිර ආධිපත්‍යයෙහි නියෝජිතයන්ගේ ප්‍රමාණය සුළු නමුත් බටහිර ආධිපත්‍යයෙහි අනුග්‍රහය ලබන ඔවුන්ට අධිපතිවාදී බලයක් වෙයි. පසුගියදා කැලණිය විශ්වවිද්‍යාලයෙහි සුළඟ එනු පිණිස සංවාදය ඇසීමට පැමිණි සතිඅන්ත පත්තර කඩමාල්ලක ජඩමාධ්‍යවේදියකු දේශනයක් සඳහා පැමිණි ආබාධිත සෙබළකු චිත්‍රපටියෙහි සන්දර්භයට අයත් “යුද්ධය” ගැන කියද්දී ඒ නවත්වන ලෙස කියා සිටියේ ඔහුගේ අධිපතිවාදී බලය පෙන්වමින් ය. මේ ජඩමාධ්‍යවේදියා අනුන් සංවිධානය කළ සංවාදයක සභාපති නිලතල අතට ගැනීමට ගියේ ය. විනයගරුකව හැසුරුණු කැලණි විශ්වවිද්‍යාල සිසුන් ජඩමාධ්‍යවේදියාට තම තරම තේරුම්ගැනීමට සලස්වා කිසිදු ශාරීරික හිංසාවකින් තොරව යන්නට ඉඩහැරියේ විද්‍යාලංකාර සම්ප්‍රදාය රකිමින් ය.

© Prof. Nalin De Silva